## හැඳින්වීම

පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අවශ්‍ය මානව සම්පත් සපුරා ලීමේ අරමුණින් දශක හතරකට වැඩි කාලයක් තිස්සේ, විවිධාකාරයේ පාඨමාලා රාශියක් පවත්වා ගෙන යනු ලබන එක ම ජාතික විශ්වවිද්‍යාලය, බවට පත්ව ඇත්තේ කැලණිය විශ්වවිද්‍යාලයයි. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය මගින් මේ වන විට සාමාන්‍ය ශාස්ත්‍රවේදී හා විශේෂ ශාස්ත්‍රවේදී (අභ්‍යන්තර) පාඨමාලා ද, සාමාන්‍ය ශාස්ත්‍රවේදී (බාහිර) පාඨමාලා ද, ඩිප්ලෝමා, ශාස්ත්‍රපති හා සමාජීය විද්‍යාපති පාඨමාලාව ද පවත්වාගෙන යනු ලැබේ. මීට අමතරව පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ දර්ශනපති (M.Phil) සහ දර්ශන විශාරද (Ph.D.) උපාධි පාඨමාලා සඳහා ද ලියාපදිංචි විය හැකිය.

## පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා

### අරමුණ

මේ පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වන්නේ පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ කටයුතු හා ක්‍රියාවලිය පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික අවබෝධයකින් පිරිපුන් වෘත්තිකයන් බිහි කරලීම ය.

### කාලසීමාව

පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ කාලසීමාව වසර 02 කි. පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ කාලසීමාව වසරකි. එක් කොටසක් සම්පූර්ණ කිරීම සඳහා වසරක් ගතවේ. වර්ෂාවසානයේ පැවැත්වෙන පරීක්ෂණයෙන් පසුව ඒ ඒ කොටස සඳහා සහතික නිකුත් කෙරේ.

## දේශන/නිබන්ධන

විශ්වවිද්‍යාලය මගින් අනුමත දේශක මණ්ඩලයක් විසින් කැලණිය විශ්වවිද්‍යාලීය දේශන ශාලාවන්හි දී ඉරිදා දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා දේශන හා නිබන්ධන පන්ති පවත්වනු ලැබේ.

### ඇතුළත්වීමේ සුදුසුකම්

1. **පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - ප්‍රථම කොටස**
   අ.පො.ස. (උ.පෙ) විෂයයන් 03 කින් එකවර සාමාර්ථ්‍යය හෝ අ.පො.ස. (සා.පෙ) සාමාර්ථ්‍යය සමග පිළිගත් පුස්තකාලයක වසරකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය. සහ අ.පො.ස. (සා.පෙ) ඉංග්‍රීසි විෂයයෙන් සාමාර්ථ්‍යය (ඉංග්‍රීසි විෂය අසමත් අය අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන ඉංග්‍රීසි පරීක්ෂණය සමත් විය යුතුය)
2. **පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - දෙවන කොටස**
   පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා ප්‍රථම පරීක්ෂණය (කැලණිය විශ්වවිද්‍යාලය) සමත්වීම හෝ ඊට සමාන සුදුසුකම්.
3. **පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමා පාඨමාලාව**
   පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා දෙවන පරීක්ෂණය (කැලණිය විශ්වවිද්‍යාලය) සමත්වීම හෝ ඊට සමාන සුදුසුකම්.

   හෝ

   පුස්තකාල විද්‍යාව විෂයක් වශයෙන් හදාරා, සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය සමත්වීම හෝ ඊට සමාන සුදුසුකම්.

## විෂය මාලා

### පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා - ප්‍රථම කොටස

- පුස්වි 13013 - තොරතුරු, පුස්තකාල හා සමාජය
- පුස්වි 13023 - එකතු සංවර්ධනය හා කළමනාකරණය
- පුස්වි 13032 - ග්‍රන්ථ වර්ගීකරණය : න්‍යාය හා ප්‍රායෝගික
- පුස්වි 13042 - සුචිකරණය : න්‍යාය හා ප්‍රායෝගික
- පුස්වි 13053 - විමර්ශන මූලාශ්‍ර සහ සේවා
- පුස්වි 13062 - පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන සඳහා තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණය : නිරීක්ෂණ වාර්තාව

### පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා - දෙවන කොටස

- පුස්වි 13073 - විඥාපන මූලාශ්‍ර සහ සේවා
- පුස්වි 13084 - ග්‍රන්ථ වර්ගීකරණය හා සුචිකරණය : න්‍යාය හා ප්‍රායෝගික
- පුස්වි 13092 - අන්තර්ජාලය, තොරතුරු ගවේෂණය හා බෙදාහැරීම
- පුස්වි 13102 - පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන කළමනාකරණය
- පුස්වි 13112 - තොරතුරු සමුද්ධරණය
- පුස්වි 13122 - පුස්තකාල සංවිධානය

### පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමා

- පුස්වි 23013 - උසස් වර්ගීකරණය
- පුස්වි 23023 - උසස් සුචිකරණය
- පුස්වි 23032 - අනුක්‍රමණිකාකරණය සහ සාරසංග්‍රහකරණය
- පුස්වි 23043 - පුස්තකාලයාධිපතිත්වයේ නව ප්‍රවනතා
- පුස්වි 23054 - පුස්තකාල ස්වයංක්‍රීයකරණය : සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම
- පුස්වි 23064 - තොරතුරු ජාල හා පද්ධති
- පුස්වි 23074 - පර්යේෂණ ක්‍රමවේදය
- පුස්වි 23083 - තොරතුරු පද්ධති තාක්ෂණය
- පුස්වි 23094 - විඥාපන කුසලතාව හා සාහිත්‍ය ගවේෂණය

**ඉගැන්වීමේ මාධ්‍යය** : සිංහල

**සම්පූර්ණ පාඨමාලා ගාස්තු**
***(ලියාපදිංචි ගාස්තු හා විභාග ගාස්තු ඇතුළත්ව)***

ඩිප්ලෝමා ප්‍රථම කොටස - රු. 30000.00
ඩිප්ලෝමා දෙවන කොටස - රු. 32000.00
උසස් ඩිප්ලෝමා පාඨමාලාව - රු. 35000.00

මෙම පාඨමාලාවට අදාළ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා හා පුහුණු වැඩසටහන් අධ්‍යයන අංශය මගින් සංවිධානය කරනු ලබයි.

**දේශන පවත්වන වේලාව**

ඉරිදා පෙ.ව. 9.00 - ප.ව. 3.00
(දේශන භෞතිකව හා මාර්ගගතව Zoom තාක්ෂණය ඔස්සේ)

**අයදුම්පත් නිකුත් කිරීමේ අවස**

**2024.08.24**



**විමසීම්**

මෙම පාඨමාලා පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය නම් පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය.

පාඨමාලා සම්බන්ධීකාරක


පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

011-2917712
011-2903901


*පාඨමාලාව පිළිබඳ වැඩි විස්තර*
https://ss.kln.ac.lk/depts/lisc/
*දරන වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.*



# පුස්තකාල හා විඥාපන විද්‍යා



## ඩිප්ලෝමා පාඨමාලා - 2024

## ශික්ෂා නිර්දේශ




**පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය**
**සමාජීය විද්‍යා පීඨය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**කැලණිය**
https://ss.kln.ac.lk/depts/lisc/


